මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உனது இல
Your No.

පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

PARLIAMENT

දුරකථනය
தொலைபேசி
Telephone Nos
2777327 / 2777287
2777100 (Ext: 6654/3201/5304)

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E - Mail
news@parliament.lk

ෆැක්ස්
தொலை நகல்
Fax
2777327

සන්නිවේදන දෙපාර්තමේන්තුව/ தொடர்பாடல் திணைக்களம் / Department of Communication

ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ / ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே / Sri Jayewardenepura, Kotte


2022.07.28

## මාධ්‍ය නිවේදනය

# ගරු තිස්ස විතාරණ මහතා හදිසි අවස්ථා ප්‍රකාශනය පිළිබඳ යෝජනා සම්මතය සඳහා ඡන්දය භාවිතා කොට නොමැති බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා සනාථ කරයි...

පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු තිස්ස විතාරණ මහතා ඊයේ (27) පාර්ලිමේන්තුවේදී විවාද කොට සම්මත කර ගන්නා ලද මහජන ආරක්ෂක පනත යටතේ වැඩබලන ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද හදිසි අවස්ථා ප්‍රකාශනය පිළිබඳ යෝජනා සම්මතය සඳහා ඡන්දය භාවිත කොට නොමැති බවට පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ලිපියක් මගින් සනාථ කර සිටියි.

මේ අනුව, ඊයේ (27) දිනයේ ඡන්ද විමසීමට අදාළ පාර්ලිමේන්තුවේ විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ වාර්තාවලට අනුව හදිසි අවස්ථා ප්‍රකාශනය පිළිබඳ යෝජනා සම්මතය සඳහා ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා ඡන්දය භාවිතා කොට නොමැත.

මෙම ඡන්ද විමසීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු තිස්ස විතාරණ මහතා විසින් හදිසි අවස්ථා ප්‍රකාශනය පිළිබඳ යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය භාවිත කළ බවට ඇතැම් මාධ්‍යවල පළ වීම නිසා මන්ත්‍රීවරයා විසින් මහලේකම්වරයාගෙන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම ලිපිය යොමු කොට තිබේ.

එච්.ඊ. ජනකාන්ත සිල්වා,
අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා / අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
072 366 9163